දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்விநிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණයෘ (දෙසැම්බර් 2017)

## ECG 1 : ආර්ථික විද්‍යාව I

- එක් කොටසකින් අඩු තරමින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න
- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබාදීම පෙන්නුම් කර ඇති පරිදිවේ
- ප්‍රස්ථාර කොල සපයනු ලැබේ. ගණක යන්ත්‍ර භාවිතා කල හැක
- කාලය **පැය තුනයි (03)**

---

### I වන කොටස

1. i. සංඛ්‍යා සුචක ප්‍රවේශයෙහි සහ ක්‍රම සුචක ප්‍රවේශයෙහි පවතින මූලික වෙනස දක්වන්න (ලකුණු 10)
   ii. 'ආන්තික උපයෝගිතාවය' යන්නෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)
   iii. මුළු උපයෝගිතාවය සහ ආන්තික උපයෝගිතාවය අතර සම්බන්ධතාවය කුමක්ද? ප්‍රස්ථාරිකව පෙන්වන්න. (ලකුණු 05)

2. i. "නිෂ්පාදන ශ්‍රිතය" නිර්වචනය කරන්න (ලකුණු 04)
   ii. ආයතනයක නිෂ්පාදන ශ්‍රිතය සහ පිරිවැය ව්‍යුහය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 08)
   iii. ආයතනයක නිෂ්පාදන ශ්‍රිතය සහ පිරිවැය ව්‍යුහය මත වැඩිදියුණු කරන ලද තාක්ෂණය භාවිතයෙහි බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 08)

3. i. උපරිම මිල පාලනයක් සහ අවම මිල පාලනයක් පැනවීමෙහි අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 10)
   ii. කුමන තත්වයක් යටතේ අවම මිල සහ උපරිම මිල ඵලදායී නොවන්නේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

4. මාසික ආදායම රු. 36.00 ක් ලබන පාරිභෝගිකයෙකුට X සහ Y භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍යව ඇත. ඒවායෙහි මුළු උපයෝගිතා ශ්‍රිත පිළිවෙලින් පහත සමීකරණ මගින් දී ඇත.

$$TU_x = 50Q_x - 5Q_x^2$$
$$TU_y = 32Q_y - 4Q_y^2$$

X ඒකකයක මිල රු. 5/= ක්ද, Y ඒකකයක මිල රු. 8/= ක්ද වේ යැයි සිතන්න

   i. පාරිභෝගිකයාගේ සමතුලිත X සහ Y ඒකක මිලදී ගැනීම් ගණනය කරන්න (ලකුණු 06)
   ii. මෙම සමතුලිතයෙහි අදහස ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? (ලකුණු 04)
   iii. සමතුලිතතාවයේදී මුදල් ඒකකයක ආන්තික උපයෝගිතාවය ගණනය කරන්න. (ලකුණු 04)
   iv. අනෙකුත් දේ ස්ථාවරව තිබියදී X භාණ්ඩයෙහි මිල රු. 2/= කින් වැඩිවූයේ යැයි සිතන්න. එවිට ඔහුගේ නව සමතුලිත මිලදී ගැනීම් කුමක් විය යුතුද? (ලකුණු 06)

5. පහත දැක්වෙන ඒවායින් ඕනෑම හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. සාමාන්‍ය භාණ්ඩයක මිල වෙනස්වීමක ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාකය

ii. පූර්ණ තරඟකාරී ආයතනයක් සඳහා සමතුලිත කොන්දේසිය ව්‍යුත්පන්න කිරීම

iii. ආයතනයක හීනවන ආන්තික නිෂ්පාදනය

iv. පරිමාණානුකූල පිරිමැසුම්

v. මිල පරිභෝජන වක්‍රය (PCC)

(කොටසකට ලකුණු 05 බැගින්)

## II වන කොටස

6. විවෘත ආර්ථික ආදර්ශයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු ඔබට ලබාදී ඇතැයි සලකන්න. (වටිනාකම් රු. මිලියන වලිනි)

පාරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.75Y^d$
පුද්ගලික ආයෝජන $I = 250$
රජයේ වියදම් $G = 200$
අපනයන $X = 50$
ඍජු බදු ශ්‍රිතය $T = 0.25Y$

i. මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 05)
ii. ආර්ථිකයේ ආදායම් ගුණකය ඇස්තමේන්තු කරන්න. (ලකුණු 05)
iii. මෙම ආර්ථිකය සඳහා ආනයන භාණ්ඩ හඳුන්වා දෙන්නේයැයි උපකල්පනය කරන්න. ආනයන ශ්‍රිතය පහත පරිදිවේ

ආනයන ශ්‍රිතය $M = \frac{1}{16}Y$

ආර්ථිකයේ නව සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 05)

iv. නව සමතුලිතයේදී ආර්ථිකයේ වෙළඳ ශේෂය ගණනය කරන්න. (ලකුණු 05)

7. i. සාර්ශික සේවා වියුක්තිය සහ ව්‍යුහාත්මක සේවා වියුක්තිය අතර වෙනස දක්වන්න. (ලකුණු 10)
ii. සේවා වියුක්ති ප්‍රශ්නය විසඳීමේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ කුමන ව්‍යුහාත්මක ප්‍රශ්න ඔබ හඳුනාගන්නේද? (ලකුණු 10)

8. i. රටක මුදල් සැපයුම පරීක්ෂා කිරීමේදී 'පුළුල් මුදල්' සංකල්පයෙහි වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 05)
ii. 'මුදල් ගුණකය' සංකල්පය සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන ඒවා මුදල් සැපයුම කෙරෙහි ඇතිකරන බලපෑම පැහැදිලි කරන්න.

a. මහ බැංකුවෙහි විවිට වෙළඳපල කටයුතු ප්‍රතිපත්තිය (ලකුණු 05)
b. මහ බැංකුවෙහි වට්ටම් අනුපාතික ප්‍රතිපත්තිය (ලකුණු 05)
c. මහ බැංකුවෙහි නීතිමය සංචිත අවශ්‍යතා ප්‍රතිපත්තිය (ලකුණු 05)

9. i. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සාපේක්ෂ පිරිවැය න්‍යාය කෙටියෙන් පැහැදිලි කර සංවර්ධනය වෙමින් පවතින රටවලට එහි යෝග්‍යතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

ii. ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයෙහි වාසි සහ අවාසි කෙටියෙන් දක්වන්න. (ලකුණු 08)

10. පහත දැක්වෙන ඒවායින් ඕනෑම හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. මුදල් ඉල්ලුම සඳහා පෙළඹවීම්

ii. මුදල් අවප්‍රමාණය කිරීම සහ ක්ෂයවීම

iii. පිලිප්ස් වක්‍රය

iv. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)

v. ගෙවුම් ශේෂයෙහි වර්තන ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම

(කොටසකට ලකුණු 05 බැගින්)

********************************

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்விநிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය: (දෙසැම්බර් 2017)
## ECG 2 : ආර්ථික විද්‍යාව II

- ඕනෑම ප්‍රශ්න **පහකට** (05) පමණක් පිළිතුරු සපයන්න
- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි
- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබාදීම පෙන්නුම් කර ඇති පරිදිවේ
- කාලය - පැය තුනයි (03)

---

1. මහා බ්‍රිතාන්‍යයේ වැඩවසම් ක්‍රමය බිඳවැටීමට වෙළඳාමේ ප්‍රසාරණය, භුවමාරු ක්‍රමවල පරිවර්තනයන් සහ කළු මරණ වසංගතය හේතුවූයේ යැයි යන අදහස විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 20)

2. කාර්මීක සංවර්ධනය සඳහා කෘෂිකාර්මික පරිවර්තනයේ ඇති වැදගත්කම තෝරාගනු ලැබූ ඕනෑම යුරෝපීය රටක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

3. 'කාර්මික විප්ලවය' යන්නෙන් ක්ෂණික වෙනස්වීමක් අදහස් නොකරන නමුත් එය අවසාන වශයෙන් රටක ආර්ථිකයේ මූලික ගති ලක්ෂණවල සිදුවන වෙනසක්වේ. 18 වන ශතවර්ෂයේ සහ 19 වන ශතවර්ෂයේ මුල් කාලයේදී මහා බ්‍රිතාන්‍යයේ සිදුවූ කාර්මීකරණ වෙනස්වීම් පාදකකොට ගනිමින් මෙම ප්‍රකාශය පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

4. ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ රජයේ කාර්‍යභාරය පිළිබඳව මහා බ්‍රිතාන්‍යයේ සහ යුරෝපා මහාද්වීපයේ සමානකම් සහ වෙනස්කම් පිළිබඳ සැසඳීමක් කරන්න. (ලකුණු 20)

5. ජර්මනියේ 'සොල්වරීනය' (Zollverein) එරට දේශීය වෙළඳපල ප්‍රසාරණයට මග පාදනලදී. සාකච්ජාකර අදහස් දක්වන්න. (ලකුණු 20)

6. ලෙනින් විසින් රුසියාවට හඳුන්වා දෙනු ලැබූ නව ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රධාන සංරචකයන් පැහැදිලි කර එමගින් රුසියානු ආර්ථිකය මත ඇතිකල බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 20)

7. 19 වන ශත වර්ෂයේදී ප්‍රංශයේ සිදුවූ ප්‍රධාන ජනවිද්‍යාත්මක වෙනස්වීම් විස්තර කොට එය එරට කාර්මීක සංවර්ධනය සඳහා බලපෑ ආකාරය විස්තර කරන්න. (ලකුණු 20)

8. පහත සඳහන් ඒවායින් ඕනෑම **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න

i. දෙවන කොටු කිරීමේ ව්‍යාපාරය

ii. යුධ කොමියුනිස්ට්වාදය

iii. වර්ෂ 1815 ධාන්‍ය නීති

iv. වාණිජවාදය (Mercantilism)

v. ඇඩම් ස්මිත්ගේ 'අදෘෂ්‍යමාන හස්තය' පිළිබඳ සිද්ධාන්තය

(4 × 5 = ලකුණු 20)

**************************

දුරස්ථ හාඅඛණ්ඩඅධ්‍යාපනකේන්ද්‍රය - පේරාදෙණියවිශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (දෙසැම්බර් - 2017)**

**ආර්ථික විද්‍යාව 111**

# ECG 3 ව්‍යවහාර ආර්ථික විද්‍යාව

**ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
**මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10කි.**
**සෑම ප්‍රශ්නයකටම දෙනු ලබන ලකුණු සංඛ්‍යාව එයට අදාළව දක්වා ඇත.**
**(කාලය පැය තුනයි)**

1. (a). 1977 දී සහ 2005 දී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ සටහන් කරන්න. (ලකුණු 10)

   (b). මෙම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂය සහ විදේශ සෘජු ආයෝජන මත කුමන බලපෑමක් ඇති කළේ ද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 10)

2. (a). ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවෙහි ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 08)

   (b). ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු කිරීමට ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 12)

3. (a). 'ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන අනුපාතිකය සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් රටවලට වඩා අඩුය.' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

   (b). නිදහසේ සිට ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයෙහි ආර්ථික බලපෑම් විභාග කරන්න. (ලකුණු 10)

4. (a). 1960 සිට ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියෙහි උපනතින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

   (b). ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියෙහි ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 10)

5. (a ). ශ්‍රී ලංකාවේ අයවැය හිඟයෙහි නොකඩවා සිදු වන ඉහළ යාමට හේතු මොනවාද? (ලකුණු 07)

(b). ශ්‍රී ලංකාවේ අයවැය හිඟය පියවීම සඳහා රජයේ ආදායම ප්‍රමාණවත් නොවීමට හේතු දක්වන්න. (ලකුණු 06)

(c). ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථිකය මත ප්‍රසාරණය වෙමින් පවතින අයවැය හිඟයෙහි බලපෑම් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

6. නිදහසේ සිට ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ වැදගත් පියවර සාකච්ඡා කරන්න. (ලකුණු 20)

7. (a). 1977න් පසු ශ්‍රී ලංකාවේ කාර්මික ප්‍රතිපත්තිය විස්තර කරන්න. (ලකුණු 08)

(b). මෙම ප්‍රතිපත්තිය රටෙහි නිෂ්පාදන සහ අපනයන ව්‍යුහය මත ඇති කරන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 12)

8. (a). ශ්‍රී ලංකාවේ වැවිලි අංශයෙහි වැදගත්කම සැකෙවින් දක්වන්න. (ලකුණු 06)

(b). 1977 සිට ශ්‍රී ලංකාවේ වැවිලි අංශය මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්න සාකච්ඡා කරන්න. (ලකුණු 14)

9. 1977න් පසු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ප්‍රශ්නය විසඳීමට ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ග මොනවාද? (ලකුණු 20)

10. ශ්‍රී ලංකාවට අදාළව පහත සඳහන් ඕනෑම **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න. (එකකට ලකුණු 05 බැගින්)

(a). වයස්ගත ජනගහනය පිළිබඳ ගැටළුව
(b). 1990ට පසු ආදායම් අසමානතාව
(c). 1977 සිට විනිමය අනුපාතික ප්‍රතිපත්තිය
(d). 1977න් පසු සමාජ සුභසාධන ප්‍රතිපත්තිය
(e). 1977න් පසු වෙළෙඳ ප්‍රතිපත්තිය
(f). ගෙවුම් ශේෂයේ සංරචක